රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

කෑගල්ල දිස්ත්‍රික්කය

------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 25 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වල වටිනාකම රු.270,087,813 ක් වුවත් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.269,212,752 ක් වීම නිසා රු.875,061 ක වෙනසක් විය.

(ආ) ප්‍රවර්තන වර්ෂයේ වරිපනම් බදු අධි ගාස්තුව රු.173,095 ක් දඩ හා වරෙන්තු ගාස්තු යටතේ ගිණුම්ගත නොකර වරිපනම් බදු යටතේ ගිණුම් ගත කිරීම නිසා වරිපනම් බදු එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා දඩ හා වරෙන්තු ගාස්තු අඩුවෙන් දැක්වුණි.

(ඇ) භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් නොවූ ටේලර් 05 ක් , ට්‍රැක්ටර් 02ක් , කම්පැක්ටර් ටේලරයක් හා කැබ් රථයක් ,වාහන හා යන්ත්‍ර සූත්‍ර ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ නිම කරන ලද කර්මාන්ත වෙනුවෙන් ලැබියයුතු හා ගෙවියයුතු රු.53,560,648 ක් සඳහා ණයගැතියන් හා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන වෙන්කර නොගැනීම නිසා ණයගැතියන් හා ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ඉදිකල කර්මාන්ත වලට අදාල රු.1,083,550 ක ගෙවීම් 2017 වර්ෂයේ වැය ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 09 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.133,438,822 ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.150,242,890 ක් වූයෙන් වෙනස රු.16,804,068 ක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම

-----------------------

2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.18,981 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

-----------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම් ශේෂයන්හි එකතුව පිළිවෙලින් රු.4,490,150 ක් හා රු.8,887,837 ක් විය.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

--------------------------------------------------

එකතුව රු.162,628,789 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාල උපලේඛන, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

1.4 නීති, රීති ,රෙගුලාසි වලට අනුකූල නොවීම.

-----------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 158 (1) (අ) වගන්තිය | වර්ෂ 04 කට වැඩි කාලයක් තුළ වරිපනම් බදු පැහැර හැර ඇති දේපොල හිමියන් ගෙන් අයවිය යුතු රු. 114,993 ක වරිපනම් බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | |
| (i) මුරෙ. 371 | 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අවස්ථා 41 කදී නිකුත් කර තිබුණු එකතුව රු.2,954,085 ක් වූ අත්තිකාරම් 2017 මැයි 17 දින වනවිටත් පියවා නොතිබුණි. |
| (ii) මු.රෙ.387 | රජයේ ආයතන විසින් බැංකු ගනුදෙනු සඳහා අයිරා පහසුකම් ලබා නොගත යුතු වුවත් ජංගම ගිණුම් දෙකක සමාලෝචිත වර්ෂයේදී අවාසිදායක බැංකු ශේෂයන් පැවතුණි. |
| (iii) මු.රෙ.396 (ඇ) | නිකුත් කළ බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ක කාලයක් ඉක්ම වූ රු.42,611ක චෙක්පත් 12 කට අදාලව කටයුතු කර නොතිබුණි. |
| (iv ) මු.රෙ. 1646 | සභාවේ වාහන 25 කට අදාල ධාවන සටහන් වර්ෂ ගණනාවක සිට විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

(ඇ) 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය

සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබුණු දූරකථන කුළුණු 02 ක් සඳහා රු.48,000 ක ගාස්තු අයකර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.24,849,459 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.6,928,231 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.17,921,228 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ රු. 17,921,228ක වර්ධනයට ආදායම් විෂයයන් 06ක වර්ධනය හා වියදම් විෂයයන් 05 ක අඩුවීම බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2016.01.01 දිනට හිඟය | 2016.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2016 වර්ෂයේ බිල් කිරීම | වර්ෂයේ බිල් කිරීම් වලින් අයවීම | 2016.12.31 දිනට හිඟය: 2016.01.01 දිනට පැවති හිඟයෙන් හිඟ | 2016.12.31 දිනට හිඟය: වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 2,625 | 1,478 | 2,094 | 1,359 | 1,147 | 735 | 1,182 |
| (ii) බදු කුලී | 3,153 | 1,321 | 7,222 | 4,426 | 1,832 | 2,796 | 4,628 |
| (iii) බලපත්‍ර ගාස්තු | 79 | - | 307 | 307 | 79 | - | 79 |
| (iv) වෙනත් ආදායම් | - | - | 3,594 | - | - | - | - |
| එකතුව | 5,857 | 2,799 | 13,217 | 6,092 | 3,058 | 3,531 | 5,889 |

ඉහත හිඟ ආදායම් වාර්තා අවසන් ගිණුම සමග සැසඳීමේදී ආදායම් ප්‍රභවයන් 03 ක බිල්කල ආදායමේ රු.7,930,000 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ආදායම් ප්‍රභවයන් 04 ක රු. 34,521,000 ක හිඟ ආදායම් වල වෙනසක් නිරීක්ෂණය විය.

2.3.2 බදුකුලී

----------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පොදු වෙළඳපල මස් කඩ හා මාළු කඩ බදු දීමේදී බදු ගිවිසුම් වලට එළඹ නොතිබීම හා එළඹී ගිවිසුම් ප්‍රකාරව මාසිකව බදු මුදල් අයකර නොගැනීම හේතුවෙන් රු.972,809 ක් හිඟ බදු පැවතුණි. හිගයට වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත්ව තිබූ අතර හිගයට අදාල බදු ගිවිසුම් ඇතුළත් ලිපිගොනු 15 ක් ඉදිරිපත් කිරීමටද සභාව අපොහොසත් විය.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2009/01 දරන චක්‍රලේඛයේ 1.11 ඡේදයේ උපදෙස් ප්‍රකාරව අතුරු බදු දීම කළහැකි වුවත් දීර්ඝ කාලයක සිට අතුරුබදු දී ඇති කඩකාමර 28 ක් සඳහා නිසි පැවරීම් සිදුකර නොතිබුණු අතර කඩකාමර 12ක් බදුදීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) වාර්ෂිකව ව්‍යාපාර පිළිබඳ තොරතුරු රැස්කර වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බද්දට යටත් ස්ථාන හඳුනාගෙන බදු අයකළයුතු වුවත් එවැනි සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර 2015 වර්ෂයේ ව්‍යාපාරික ස්ථාන 786 කින් බදු ලැබී තිබුණද 2016 ඔක්තෝබර් 31 දිනට ව්‍යාපාරික ස්ථාන 289 කින් පමණක් බදු අයකර තිබුණි. බදු නොගෙවූ ස්ථාන හඳුනාගෙන බදු අයකර ගැනීමට හෝ පනතේ විධිවිධාන ප්‍රකාරව නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2016 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 ජනවාරි 08 දින ගැසට් නිවේදනයේ iv (ආ) කොටසේ පලකර ඇති ආකාරයට සභා බල ප්‍රදේශයේ 2016 වර්ෂයේ පවත්වාගෙන යන සෑම ව්‍යාපාරයක් සඳහාම 2015 වර්ෂයේදී ඉපයූ ආදායම් අනුව ව්‍යාපාර බද්දක් 2016 වර්ෂයට නියම කළයුතු වුවත් ඊට පටහැනිව බදු අයකර තිබුණි.

(ඉ) සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කරන පෝස්ටර් ,කටවුට්, බැනර් කොපමණ ප්‍රමාණයක් ප්‍රදර්ශනය කරනු ලබන්නේද යන්න පිළිබඳ සභාව හඳුනාගෙන නොතිබුණු අතර විශාල ප්‍රමාණයේ ස්ථාවර දැන්වීම් පුවරු 53 ක් සඳහා ගාස්තු අයකර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 කාර්යසාධනය

-------------------

විවිධ කාර්යයන් ඉටුකිරීම සඳහා ආයතන වලින් ලැබී තිබූ රු.2,503,306 ක් එම කාර්යයන් සඳහා යෙදවීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ තනතුරු 09 ක නිලධාරින් 11 ගේ පුරප්පාඩු හා තනතුරු 7 ක නිලධාරින් 31 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. කම්කරු තනතුරු සඳහා අනුමත ප්‍රමාණය ඉක්මවා 06 දෙනෙකු සිටියදී කොන්ත්‍රාත් පදනම මත පුද්ගලයන් 16 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) ස්ථාන මාරුවී ගිය , විශ්‍රාම ගිය හා සේවය හැරගිය සේවකයන් 06 දෙනෙකුගෙන් වර්ෂ ගණනාවක සිට අයවිය යුතු රු.378,583 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

2013 වර්ෂයේදී කට්ටිකර විකුණන ලද අක්කර 12 රූඩ් 03 පර්චස් 10 ක ඉඩමකින් පොදු පහසුකම් සඳහා ලබාගත යුතු සියයට 10 ක ඉඩම් ප්‍රමාණයට වඩා රූඩ් 02 පර්චස් 12.04 ක බිම් ප්‍රමාණයක් අඩුවෙන් ලබාගෙන තිබුණි. එසේම 2010 වර්ෂයේදී අක්කර 7 පර්චස් 3.5 ක ඉඩම කොටස්කර විකිණීමේදී විකුණුම්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබූ අතර, සියයට 10 ක පොදු පහසුකම් සඳහා වන ඉඩම් කොටසද පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පිරිවැය රු.5,250,000 ක් වූ ට්‍රැක්ටර් 03ක් අලුත්වැඩියා නොකර 2014 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි.

(ii) වටිනාකම රු.904,174 ක් වූ වාහන හා යන්ත්‍ර ,වටිනාකම සඳහන් නොවූ කැබ් රථයක් හා ට්‍රේලරයක් වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(iii) වටිනාකම රු.485,458 ක් වූ ජංගම වේදිකාව හා උපාංග රුවන්වැල්ල මහජන ක්‍රීඩාංගනයේ එළිමහන් ස්ථාන 02 ක අක්‍රමවත්ව ගොඩගසා තිබුණු අතර මෙම වේදිකාව වසර 1 ½ ක පමණ කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(iv) වසර ගණනාවක සිට අක්‍රීය බැංකු ගිණුම් 02 ක පිළිවෙලින් රු. 1,140 ක ශේෂයක් හා රු.3,133 ක අවාසිදායක ශේෂයක් විය.

3.5 හඳුනාගත් අලාභ

--------------------

1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 31 අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.4,645 ක් වූ චෙක්පත් දෙකක් අගරු වී සභාවට පාඩුවක් සිදුවී තිබුණි.

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------

මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ රු.18,089,500 ක් වැය කර ඉදල්පොල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය 2014 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. මෙම මධ්‍යස්ථානය දිරන කසල පමණක් සකස් කරන මධ්‍යස්ථානයක් වූයෙන් නොදිරන කසල ඒ ආසන්නයේ ගොඩගැසීම නිසා මැස්සන් බෝවීම මඟින් ගම් වැසියන්ට ලෙඩරෝග පැතිරීමත් ඊට ජනතා විරෝධය එල්ලවීම මත මධ්‍යස්ථානය වසා දමා තිබූ අතර මේ දක්වා ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණි. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කර එම අධිකාරියේ නිලධාරින්ගේ සහයෝගය ලබා දීමට හැකි බව දන්වා තිබුණද එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනොතිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් දෛනිකව එකතුවන කසල අවිධිමත් ලෙස පෞද්ගලික ඉඩම් වලට බැහැර කර තිබුණි. 2016 වර්ෂයේදී කසල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා රු.7,892,000 ක් වැය කර තිබූ අතර කසල බැහැර කිරීමේ කටයුතු සඳහා රු.6,546,000 ක් වැයකර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

4.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 25 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ අතර ඉකුත් වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන 2016 මැයි 09 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

4.2 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයයන් 37 ක එකතුව වූ රු. 27,395,000 ක ප්‍රතිපාදන සියයට 100 ක් හා වැය විෂයයන් 17 ක එකතුව වූ රු.2,906,367 ක ප්‍රතිපාදන වලින් සියයට 80 ත් 99 අතර ප්‍රතිශතයකින් උපයෝජනය කර නොතිබුණි.

4.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

---------------------------------------

කාර්යාලයේ හා ප්‍රිමික්ස් ව්‍යාපෘතියේ රු.8,250 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා පුස්තකාල 04 ක රු.5,855 ක් වූ පුස්තකාල පොත් ඌනතාවයක් පැවතුණි.

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | <u>පද්ධතිය</u> | <u>නිරීක්ෂණය</u> |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම<br>(ii) විවිධ තැන්පත් ,කඩකුලී,සේවක ණය,අත්තිකාරම් ලේඛන යාවත් කාලීන නොකිරීම<br>(iii) ණයගැතියන් හා ණයහිමියන් අඩුවෙන් ගිණුම්ගත කිරීම<br>(iv) අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු නොකිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | (i) හිඟ ආදායම් අයකර නොගැනීම<br>(ii) බලපත්‍ර ගාස්තුඅය නොකිරීම<br>(iii) මස් හා මාළුකඩ සඳහා බදු ගිවිසුම් වලට නොඑළඹීම<br>(iv) බදුකුලී වසර 05 කට වරක් සංශෝධනය නොකිරීම<br>(v) වාර්ෂික සමීක්ෂණ මඟින් බලපත්‍ර හා ව්‍යාපාර බද්දට යටත් වන ස්ථාන හඳුනා නොගැනීම<br>(vi) ප්‍රදර්ශනය කරන දැන්වීම් පිළිබඳ සමීක්ෂණයක් සිදු නොකිරීම |
| (ඇ) | වාහන පාලනය | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඉදිරිපත් නොකිරීම |
| (ඇ) | මුල්‍ය පාලනය | (i) මුල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් නොකිරීම<br>(ii) අවිනිශ්චිත ගිණුම් පියවීමට කටයුතු නොකිරීම<br>(iii) අයිරා පහසුකම් ලබා ගැනීම<br>(iv) කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම |
| (ඉ) | අයවැය පාලනය | වැය ප්‍රතිපාදන වල සැලකිය යුතු ප්‍රමාණයක් ඉතිරිව තිබීම. |